

# තුන්වන ශ්‍රේණිය

# ගණිතය

## තුන්වන වාරය

**ගුරු මාර්ගෝපදේශයට අනුව සම්පාදිතයි**

සැකසුම - මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# සංඛ්‍යා පටිපාටිගත කිරීම



## ක්‍රියාකාරකම 01- විශාල හා කුඩා සංඛ්‍යාව සොයමු

**සපයාගත යුතු දේ -**

- දිග හා පළල අඟල් දෙකක් වූ කාඩ්පත් කපාගන්න
- එම කාඩ්පත්වල පහත සංඛ්‍යා පැහැදිලිව ලියාගන්න

| | | | | |
|---|---|---|---|---|
| 4 | 9 | 5 | 15 | 32 |
| 34 | 57 | 73 | 23 | 84 |

- කුඩා වට්ටි හෝ පෙට්ටි දෙකක්
- එම භාජන දෙකෙහි **කුඩා** **විශාල** යන ලේබල් දෙක අලවාගන්න

**දෙමාපියන්ට උපදෙස්**

- සකස් කර ගත් සංඛ්‍යා කාඩ්පත්වලින් 4 සහ 9 යන කාඩ්පත් දරුවාට පෙන්වා සංඛ්‍යාව විමසන්න.
- එයින් කුඩා සංඛ්‍යාව "කුඩා"යන ලේබලය ඇලවූ පෙට්ටියටත්, විශාල සංඛ්‍යාව "විශාල" යන ලේබලය ඇලවූ පෙට්ටියටත් දැමීමට දරුවාට කියන්න.
- ඊළඟට 5 සහ 15 යන කාඩ්පත් දෙකෙන් කුඩා හා විශාල සංඛ්‍යාව තෝරා අදාළ භාජනවලට දැමීමට දරුවාට කියන්න. මේ ආකාරයටම 15 හා 34 කාඩ්පත් ද විශාල හා කුඩා සංඛ්‍යාව ලෙස වෙන්කර භාජනවලට දැමීමට කියන්න
- මීළඟට 57 හා 73 යන සංඛ්‍යා කාඩ්පත් දරුවාට පෙන්වා එම සංඛ්‍යාව කුමක්ද ?අසමින් පිළිතුරු ලබාගන්න.
- 57 සංඛ්‍යා කාඩ්පත පෙන්වමින් එහි ඇති දහයේ ඒවා ගණන හා එකේ ඒවා ගණන විමසන්න. (දහයේ ඒවා 5, එකේ ඒවා 7ලෙස)

- එලෙසම 73 සංඛ්‍යා කාඩ්පත පෙන්වා එම සංඛ්‍යාවේ දහයේ ඒවා සහ එකේ ඒවා ගණන විමසන්න.පිළිතුරු ලබාගන්න. (දහයේ ඒවා 7, එකේ ඒවා 3 ලෙස)
    - 57 හි දහයේ ඒවා 5 කි
    - 73 හි දහයේ ඒවා 7 කි.
- 73 හි දහයේ ඒවා වැඩි නිසා එය විශාල සංඛ්‍යාව ලෙස හඳුන්වා දෙන්න.
- 57හි දහයේ ඒවා අඩු නිසා එය කුඩා සංඛ්‍යාව ලෙස හඳුන්වා දෙන්න.
- විශාල සංඛ්‍යාව "විශාල" ලෙස නම් කළ භාජනයටත් කුඩා සංඛ්‍යාව " කුඩා " ලෙස නම් කළ භාජනයටත් දැමීමට දරුවාට කියන්න
- සකස් කර ගත් සංඛ්‍යා කාඩ්පත් සියල්ල මේසය මත මුණින් අතට හරවා තබන්න.
- ඉන් කැමති සංඛ්‍යාපත් දෙකක් ගැනීමට දරුවාට පවසන්න.
- ඒවායේ දහයස්ථානයේ ඇති ඉලක්කම අනුව කුඩා සංඛ්‍යාව හා විශාල සංඛ්‍යාව තෝරා අදාළ භාජනවලට දැමීමට දරුවාට කියන්න
- මෙලෙස සංඛ්‍යා කාඩ්පත් අවසන් වන තුරු මෙම ක්‍රියාකාරකමෙහි යෙදෙන්නට දරුවාට කාලය ලබාදෙන්න.

**ක්‍රියාකාරකම 02 - ඉලක්කම් 3 හි සංඛ්‍යා දෙකක විශාල හා කුඩා සංඛ්‍යාව සොයමු**

**සපයාගත යුතු දේ -**

- පහත සංඛ්‍යා කාඩ්පත් සකස් කර ගන්න.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 576 | 450 | 725 | 431 | 573 | 562 | 853 |
| 868 | 405 | 722 | 728 | 653 | 652 | 457 |

- විශාල හා කුඩා ලේබල ඇලවූ භාජන දෙක

**දෙමාපියන්ට උපදෙස්**

- පළමුව 725 හා 431 කාඩ්පත් දෙක ගෙන එම සංඛ්‍යා දරුවාගෙන් විමසන්න.

  725- හත්සිය විසි පහ

  431- හාරසිය තිස් එක

- සංඛ්‍යා දෙකෙහි සියයස්ථානයේ ඇති ඉලක්කම විමසන්න.

  725 - සියයේ ඒවා 7 යි

  431 - සියයේ ඒවා 4 යි

- සියයස්ථානය අනුව 7 ඉලක්කම අගය වැඩි බවත් 4 ඉලක්කම අගය අඩු බවත් පැහැදිලි කරදෙන්න.
- සියයස්ථානයේ අගය අනුව විශාල සංඛ්‍යාව හා කුඩා සංඛ්‍යාව තේරීමට දරුවාට කියන්න
- කුඩා සංඛ්‍යාව 431 සහ විශාල සංඛ්‍යාව 725 බව තහවුරු කරන්න.

- පහත සංඛ්‍යාවලින් විශාල හා කුඩා සංඛ්‍යාව තෝරා බඳුන් තුළට දැමීමට දරුවාට කියන්න.
    - 562, 431
    - 853, 573
    - 573, 431
- 431 සහ 450 යන කාඩ්පත් දෙක දරුවාට පෙන්වමින් සංඛ්‍යා හඳුනාගැනීමට දරුවාට කියන්න.
- එහි කුඩා හා විශාල සංඛ්‍යාව තේරීමට යොමු කරන්න.
- සියයස්ථානයේ ඇති ඉලක්කම අනුව තේරීමට හැකිද ? යන්න විමසන්න.
- සියයස්ථානයේ ඇති ඉලක්කම සමාන බව පවසන්න.
- එබැවින් දහයස්ථානයේ ඇති ඉලක්කම අනුව තෝරමු යයි පවසමින් දහයස්ථානයේ ඇති ඉලක්කම් දෙක කුමක්ද ?යන්න දරුවාගෙන් විමසන්න.

450 හි දහයස්ථානයේ ඇති ඉලක්කම 5

431 හි දහයස්ථානයේ ඇති ඉලක්කම 3

- ඒ අනුව කුඩා සංඛ්‍යාව හා විශාල සංඛ්‍යාව තෝරා භාජනවලට දැමීමට දරුවාට කියන්න.
- පහත සංඛ්‍යා යුගලවල කුඩා හා විශාල සංඛ්‍යාව වෙන්කර බඳුන් දෙකට දැමීමට දරුවාට කියන්න.
    - 562 හා 573
    - 868 හා 853
    - 405 හා 450
- 576 හා 573 කාඩ්පත් දෙක දරුවාට පෙන්වා සියයස්ථානයේ ඇති ඉලක්කම් හා දහයස්ථානයේ ඇති ඉලක්කම් පිළිබඳ විමසන්න.

| | සියයස්ථානය | දහයස්ථානය |
|---|---|---|
| 576 | 5 | 7 |
| 572 | 5 | 7 |

මෙහිදී සියයස්ථාන හා දහයස්ථානවල ඇති ඉලක්කම් අනුව කුඩා හා විශාල සංඛ්‍යාව තේරීමට නොහැකි බව පැහැදිලි කරන්න.

- එමනිසා එකස්ථානයේ ඇති ඉලක්කම අනුව කුඩා හා විශාල සංඛ්‍යාව තෝරන බව පවසන්න.
  - 576හි එකස්ථානයේ ඉලක්කම 6
  - 573 හි එකස්ථානයේ ඉලක්කම 3

එමනිසා කුඩා සංඛ්‍යාව 573

විශාල සංඛ්‍යාව 576 බව පෙන්වා දෙන්න.

- පහත සංඛ්‍යාපත් යුගලවල කුඩා හා විශාල සංඛ්‍යා වෙන් කර බඳුන් දෙකට දැමීමට දරුවාට කියන්න.
  - 457 ,450
  - 722 ,728
  - 652 ,653
- නිවැරදි විය යුතු නම් නිවැරදි කර පෙන්වන්න.

## ක්‍රියාකාරකම 03

### සපයාගත යුතු දේ

- 1 සිට 9 තෙක් සංඛ්‍යා ලියූ කාඩ්පත් 9 ක්
- 10, 22, 28, 885, 240, 561 යන සංඛ්‍යා ලියූ කාඩ්පත්

### දෙමාපියන්ට උපදෙස්

- 5,3,8යන කාඩ්පත් දරුවාට පෙනෙන ලෙස මේසය මත තබන්න.
- ඒ අතරින් කුඩාම සංඛ්‍යාව දරුවාගෙන් විමසන්න.
- තේරූ සංඛ්‍යාව වැරදි නම් තව අවස්ථාවක් ලබා දී නිවැරදි කාඩ්පත තේරීමට උදවු කරන්න.

- තේරූ සංඛ්‍යාව 3 වෙනම තබන්න.
- දැන් ඉතිරි කාඩ්පත් දෙක අතරින් කුඩා සංඛ්‍යාව තේරීමට දරුවාට කියන්න.
- එය කලින් තේරූ සංඛ්‍යාවට දකුණු පැත්තෙන් තබන්න.

3,5

- ඉතුරු සංඛ්‍යාපත ද දකුණු පසින් තබන්න.

3, 5, 8

- මෙහි කුඩාම සංඛ්‍යාව පළමුව ද ඊට විශාල සංඛ්‍යාව දෙවනුව ද විශාලම සංඛ්‍යාව අවසානයේ ද ඇති බව පැහැදිලි කරන්න.
- කුඩාම සංඛ්‍යාවේ සිට විශාල සංඛ්‍යාව දක්වා අනුපිළිවෙළට තබා ඇති බව පවසන්න.
- මීළඟට 28 ,10 ,22 සංඛ්‍යාපත් ලබා දී කුඩා සංඛ්‍යාවේ සිට විශාල සංඛ්‍යාව දක්වා අනුපිළිවෙළට තැබීමට දරුවාට කියන්න.
- ඉලක්කම් තුනේ පහත සංඛ්‍යා තුන මේසය මත තබන්න.

385, 240, 561

- සංඛ්‍යාව කියවීමට දරුවාට අවස්ථාව ලබාදෙන්න.
- පළමුව ඇති සංඛ්‍යා දෙකෙන් කුඩා සංඛ්‍යාව හඳුනාගැනීමට දරුවාට කියන්න.

385 හා 240 දෙකෙන් 240 කුඩා සංඛ්‍යාව වේ.

- එය මේසයේ වෙනම තබන්න.
- මීළඟට 385 සහ 561යන සංඛ්‍යා දෙකෙන් කුඩා සංඛ්‍යාව තේරීමට දරුවාට කියන්න.(සියයස්ථානයේ ඇති ඉලක්කමෙන්)
- එම සංඛ්‍යාව 240 කාඩ්පතට දකුණු පැත්තෙන් තබන්න.

240,385

- ඉතුරු සංඛ්‍යාව ඊළඟට දකුණු පසින් තබන්න.

  240, 385, 561

- මෙහි අනුපිළිවෙළට කුඩා සංඛ්‍යාවේ සිට විශාල සංඛ්‍යාව දක්වා ඇති බව පවසන්න.
- එය පොතේ ලිවීමට දරුවාට කියන්න.
- මීළඟට 1සිට 9 තෙක් සංඛ්‍යාපත් ඇසුරින් ඉලක්කම් තුනේ සංඛ්‍යා තුනක් සකස් කිරීමට දරුවාට කියන්න.
- පෙර පරිදි සංඛ්‍යා තුන, දෙක බැගින් ගෙන සංසන්දනය කර කුඩාම සංඛ්‍යාවේ සිට විශාල සංඛ්‍යාව දක්වා අනුපිළිවෙළට සකස් කර ලිවීමට අවස්ථාව ලබාදෙන්න.
- මෙලෙස තවත් සංඛ්‍යා තුන බැගින් සාදමින් ඒවා අනුපිළිවෙළට සකස් කර ලිවීමට දරුවාට කියන්න.

ගණිතය පෙළපොතේ පිටු අංක 42,43 හි ඇති අභ්‍යාස සඳහා මඟ පෙන්වන්න .